# ශ්‍රී ලංකාවේ ගොවි ජනපද තුළ සමාජ ආර්ථික විෂමතාවයන් වර්ධනය වීම කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳ අධ්‍යයනයක්
## (මහවැලි 'එච්' කලාපය ආශ්‍රයෙන්)

එස්.එම්.එස් සේරසිංහ බණ්ඩාර
**නො. 199, වැලම්ටියාව, නාරම්මල**

## ABSTRACT


හැඳින්වීම

ශ්‍රී ලංකාවට පැමිණි මුල්ම ආර්යයන් මහවැලිගඟ, වලවේගඟ, මල්වතුඔය යන ගංගාවන් පදනම් කරගෙන තම මුල්ම ජනාවාස ඉදිකරගෙන තිබේ. මේ කාලයේ දී ගොවිතැන, වෙළදාම, සත්ව පාලනය සිදු කරමින් තම ජීවනෝපාය සිදුකර තිබේ.

ලෝකයේ දේශගවේශනයන් දියුණුවත්ම ලංකාවටද විදේශීය ආක්‍රමණකයින්ගේ බලපෑම දැඩිව එල්ල වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 1796 දී ඉංග්‍රීසින් මෙරටට පැමිණීමත් සමග මෙරට ගොවි ආර්ථිකය, වතු වැවිලි ආර්ථිකයක් ලෙස පරිවර්තනය විය. ඉන් පසු මෙරටට අවශ්‍ය සහල් නිපදවීම අඩපණ විය. එහි ප්‍රතිඵලය වූයේ විදේශ රටවලින් සහල් ආනයනය කිරීමට සිදුවීමයි. ඒ සඳහා විශාල මුදලක් ගෙවීමට සිදුවීම හේතුවෙන් මෙරට නැවත වතාවක් වී ගොවිතැන දියුණු කිරීම සඳහා 1928 පසු ගොවි ජනපද ආරම්භකර ගොවීන්ට ඉඩම් බෙදා දී වී ගොවිතැන දියුණුකර තිබේ.

අරමුණ

ගොවි ජනපද තුළ සමාජ ආර්ථික විෂමතාවන් වර්ධනය වීම කෙරෙහි බලපාන ලද හේතු හඳුනා ගැනීම, බොහෝ ගොවි ජනපද ගොවීන් නොදියුණු වීමට බලපාන ලද හේතු හඳුනාගැනීම හා මේ විෂමතාවන් වලට යෝජනා ඉදිරිපත් කිරීම. මෙම අධ්‍යයනයේ අරමුණයි.

ක්‍රමවේදය

මහවැලි ගොවිජනපද කලාප අතරින් මහවැලි 'එච්' කලාපය තෝරාගෙන එහි ගොවි පවුල් 500 දෙනෙකු සසම්භාවී ලෙස ගම්මානවලින් තෝරාගෙන ප්‍රශ්නාවලියක් මඟින් හා සම්මුඛ සාකච්ඡා මඟින් ඔවුන් ළඟට ගොස් ඔවුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සිදුකළ අතර, මීට අමතරව ග්‍රන්ථ, වාර සඟරා, ලිපි හා පුවත්පත් මඟින්ද දත්ත ලබාගන්නා ලදී.

දත්ත විශ්ලේෂණය

ගොවි පවුල් 500 දෙනෙකු මඟින් ලබාගන්නා ලද දත්ත ඔවුන්ගේ ආදායම, වියදම, සමාජ තත්වය, ඉඩම් ප්‍රමාණයන් යන නිර්ණායක මත කාණ්ඩ කර පරිගණකය උපයෝගී කරගෙන විශ්ලේෂණය කර තිබේ. එමඟින් විවිධ විෂමතාවන් සඳහා හේතු සංඛ්‍යාලේඛණ මඟින්ද ප්‍රස්ථාරිකවද පැහැදිලි කිරීමට හැකිවිය.

යෝජනා

එකම ප්‍රදේශයකින් තෝරාගත් ගොවි පවුල් එකම ගමක පදිංචි කළ යුතුය. ජාතිය, ආගම, කුලය යන සමාජීය තත්වයන් එකසමාන විය යුතුයි.


**Key Words**

වැවිලි ආර්ථිකය, ආක්‍රමණිකයින්, ගොවි ජනපද, විෂමතාවයන් විශ්ලේෂණය.